ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

## **පුවත්පත් නිවේදනය**

## **ශ්‍රී ලංකාවේ දී ඉන්දියානු ව්‍යවස්ථා දිනය සැමරේ**

2022 නොවැම්බර් 26 වන දිනට යෙදෙන ඉන්දීය ව්‍යවස්ථා දිනය සැමරීම සඳහා ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් වැඩසටහන් මාලාවක් සංවිධානය කර තිබිණ. 1949 නොවැම්බර් 26 වන දින ඉන්දියානු ව්‍යවස්ථාව සම්මත කිරීම මෙම විශේෂ දිනයේදී සමරනු ලැබේ.

2. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල පාසල් දරුවන් 200කට අධික පිරිසක් 2022 නොවැම්බර් 26 වන දින පැවති ළමා චිත්‍ර තරඟයට මහත් උනන්දුවකින් සහභාගී වූහ. “Incredible India” සහ “මූලික වගකීම්” වැනි තරඟයේ තේමාවන් ඉන්දියාවට සහ ඉන්දීය ව්‍යවස්ථාවට ඉතා සමීප අතර ශ්‍රී ලංකාවේ කුඩා නිර්මාණශීලී දරු දැරියන්ට සිය ශිෂ්ටාචාරමය සඟයා වන ඉන්දියාව පිළිබඳව මනා වැටහීමක් ඇති කරවීමට සමත් විය. මෙම වැඩසටහනෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වූ ගෝපාල් බාග්ලේ මහතා මෙවන් තරඟ සඳහා සහභගී වීමට දරුවන් දිරි ගන්වමින් මීළඟ පරපුරේ හැකියාවන් පෝෂණය කිරීම සම්බන්ධයෙන් දරුවන්ගේ මව්පියන් සහ ගුරුවරුන්ට සිය ප්‍රශංසාව පළ කළේය.

3. අනාගත පරපුර උදෙසා පරිසරය පිළිබඳ වගකීමකින් කටයුතු කිරීම සම්බන්ධයෙන් දරුවන් තුළ හැඟීමක් ඇති කිරීම අරමුණු කරගත් වැඩමුළුවක් ද මෙහිදී පැවැත්විණ. මෙම වැඩමුළුවේදී ඉවතලන ද්‍රව්‍යයන්ගෙන් පරිසර හිතකාමී නිර්මාණ සිදු කරන ආකාරය පිළිබඳව දරුවන්ට දැනුම ලබා දෙන ලදී. “ඉන්දියානු ව්‍යවස්ථාව සැකසීම” යන මැයෙන් පැවති ප්‍රදර්ශනයේදී ලොව විශාලතම ලිඛිත ව්‍යවස්ථාව

යථාර්ථයක් බවට පත් කළ ඉතිහාසය සහ පසුබිම් සිද්ධි ප්‍රදර්ශනය කරන ලදී.

4. මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරිහු ඉන්දියානු ව්‍යවස්ථාවේ ප්‍රධාන නිර්මාතෘ ආචාර්ය බී. ආර්. අම්බෙඩ්කාර් මහතාගේ ඡායාරූපයට පුෂ්පෝපහාර ද දැක්වූහ. මෙයට පෙර පැවති වැඩසටහනක දී මහ කොමසාරිස්තුමා සහ මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරින් විසින් ඉන්දියාවේ මාර්ගෝපදේශ ප්‍රතිපත්තීන් වලින් සමන්විත ඉන්දියානු ව්‍යවස්ථාවේ පූර්විකාව කියවන ලදී.

5. 1949 නොවැම්බර් 26 වන දින ඉන්දියානු ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් අනතුරුව 1950 ජනවාරි 26 වන දින එය බලාත්මක කරන ලදී. මෙම සුවිශේෂී දිනය සිහි කරමින් සෑම වසරකම ලොව පුරා ඉන්දියානුවෝ “ජනරජ දිනය” මහත් අභිමානයකින් සමරති. විවිධ රටවල මනා පිළිවෙත් සහ ක්‍රමවේදයන්ගෙන් ආභාෂය ගෙන සකස් කරන ලද ඉන්දියානු ව්‍යවස්ථාව ඉන්දියාවේ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ තීරණ ගැනීමේ මූලික පදනම වේ.

***

**කොළඹ**
**2022 නොවැම්බර් 28**